**පළාත් මාර්ග ව්‍යාපෘතිය ( උතුරු පළාත ) - ඒ.3 සහ බී .3 කොටස් (පමාව්‍යා) - 2013**

**------------------------------------------------------------------------------------------**

පළාත් මාර්ග ව්‍යාපෘතියේ (උතුරු පළාත) - ඒ.3 සහ බී.3 කොටස් (පමාව්‍යා) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630- එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි 11 (ආ) 3 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර ) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2010 මැයි 23 දින එළඹි ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමේ 2.01(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම සහ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම අනුව , පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකාවේ උතුරු පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු පළාත් සභාවේ ස්ථාපිත කරන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වැඩි දියුණු කරන ලද මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මඟින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ සමාජ - ආර්ථික මධ්‍යස්ථානවලට ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි. ඉහත සඳහන් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය විගැහි (SDR) මිලියන 66,100,000 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි. 2010 මාර්තු 31 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර 2015 මාර්තු 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්

**----------------------------**

ගිවිසුමට අනුව , ව්‍යාපෘතියේ ඒ.3 , බී.3 හා සී කොටස් යටතේ ක්‍රියාකාරකම් සාරාංශ කර පහත දැක්වේ.

ඒ.3 කොටස

පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරිම

--------------------------------------

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ තෝරා ගත් ප්‍රදේශවල ආසන්න වශයෙන් පළාත් මාර්ග කිලෝ මීටර් 100 ක් සහ වෙනත් මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම.

බී.3 කොටස

නඩත්තු කිරීමේ වැඩ සටහන

------------------------------

උතුරු පළාතේ ගල් අතුරා තාර දමන ලද මාර්ග ජාලය සඳහා ක්‍රමික , නිවාරක හා හදිසි නඩත්තු සිදුකිරීම් ඇතුළත් ඵලදායි කළමනාකරණ ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

සී - කොටස

ක්‍රියාත්මක කිරීමේ සහාය හා ධාරිතා ගොඩනැගීම

----------------------------------------------------

කාර්මික සහාය ( ව්‍යාපෘතියේ ඒ කොටස යටතේ වැඩ කොන්ත්‍රාත්තු අධීක්ෂණය ඇතුළත්ව ) හා පුහුණු කිරීම, කාර්යාල හා රසායනාගාර උපකරණ හා වාහන අත්පත් කර ගැනීම සහ තෝරාගත් අධ්‍යයන සිදුකිරීම මඟින් සැලසුම් කිරීම සහ අයවැය කළමනාකරණය හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා දේශීය ඉදිකිරීම් කර්මාන්තයේ ධාරිතාවය ශක්තිමත් කිරීම.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු , වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මුල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වුයේද යන බව

**3. මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

**----------------------**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.542,568,595 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,223,488,881 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම , ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | **රු.** | **රු.** | **රු.** |
| සිවිල් වැඩ | 459,483,141 | 370,277,508 | 978,802,668 |
| පිරියත හා උපකරණ | - | 1,982,186 | 6,645,200 |
| උපදේශක සේවා | 70,776,039 | 61,546,564 | 196,861,795 |

| | | | |
|---|---|---|---|
| වර්ධක හා මෙහෙයුම් පිරිවැය | 12,309,415 | 13,024,459 | 41,179,218 |
| | ---------------- | ------------------ | ------------------ |
| | 542,568,595 | 446,830,717 | 1,223,488,881 |

**4.2 අග්‍රිම අරමුදල් ගිණුම**

---------------------

මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට ගිණුමේ පැවති ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| | ---------- | ------ |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 3,396,722 | 431,929,896 |
| එකතු කළා :-ඌනපුරණයන් | 3,396,338 | 444,813,183 |
| විදේශ විනිමය වාසිය | - | 4,171,131 |
| | ---------------- | ------------------ |
| | 6,793,060 | 880,914,210 |
| අඩු කළා - ආපසු ගැනීම් | 4,186,696 | 540,124,304 |
| | -------------- | ----------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,606,364 | 340,789,906 |

**5. විගණන නිරික්ෂණ**

--------------------

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

( අ ) වැඩ පැහැර හැරී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණු රු.90,868,521 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් පසුව ඇප බැඳුම්කර මගින් අයකර ගෙන භාණ්ඩාගාරයට ආපසු ගෙවා තිබුණි. කෙසේ වුවද ඒ සඳහා අවශ්‍ය සටහන් සිදුකර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති වියදම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වැඩ පැහැර හැරී කොන්ත්‍රාත්කරුවකුගේ රු.62,987,352 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරයක් මුලා ප්‍රකාශනවලට ගිණුම්ගත කිරීමෙන් තොරව මුදල් කර පළාත් අරමුදල් ගිණුමට බැරකර තිබුණි.

**5.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------

විදුලි කණු හා දුරකථන කණු වෙනත් තැනකට ගෙනයාමට අදාළව ලංකා විදුලි බල මණ්ඩලයට හා ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත ගෙවිය යුතු පිළිවෙලින් රු.මිලියන 50.7 ක් හා රු.මිලියන 14.4 ක් වූ ගෙවීම් දෙකක් සෘජුවම කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. කෙසේ වුවද කරන ලද ගෙවීම් විස්තර, වැඩ ඇස්තමේන්තු, වැඩ නිමකිරීම් වාර්තා, කෙරීගෙන යන වැඩ ආදී විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**6. මූලා හා මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------------

**6.1 අරමුදල් උපයෝජනය**

-----------------------

අරමුදල් මූලායනය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට සමාලෝචිත වර්ෂය සඳහා ලබාදුන් අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත දැක්වේ.

| **ප්‍රභවය** | **මූලායනය කිරීම සඳහා එකඟ වූ මුදල** | | **වාර්ෂික අයවැය ප්‍රතිපාදනය** | **සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල** | | **2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල** | |
|---|---|---|---|---|---|---|---|
| | **එජඩො මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** |
| ජාසංසං | 20.0 | 2,285.00 | 755.0 | 3.40 | 540.12 | 8.88 | 1,125.40 |
| ශ්‍රීලංර | - | - | 5.00 | - | 2.44 | - | 8.22 |
| එකතුව | 20.0 | 2,285.00 | 760.00 | 3.40 | 542.56★ | 8.88 | 1,133.62★ |

★ උපචිත වියදම් සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිකර්මය හේතුවෙන් ඉහත උපලේඛනයේ දැක්වෙන මුදල් ප්‍රමාණයන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන ප්‍රමාණයන් හා එකඟ නොවේ.

## 6.2 භෞතික කාර්ය සාධනය

## 6.2.1 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) පැකේජ අංක 03 හා 05 ට අදාළ කොන්ත්‍රාත්තු නැවැත්වීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ එකඟත්වය 2012 ජුලි 25 දින ලැබී තිබුණද, එම පැකේජ දෙකෙහි කොන්ත්‍රාත්තු නවත්වා තිබුණේ මාස 4 ක් ප්‍රමාද වී 2012 නොවැම්බර් 23 දිනදීය. නවත්වා තිබු කොන්ත්‍රාත්තු නැවත ප්‍රදානය කර තිබුණේ මාස 15 ක් ප්‍රමාදවී 2013 නොවැම්බර් 02 දිනදීය.

(ආ) ව්‍යාපෘතියේ පුනරුත්ථාපන කොටස යටතේ කරන ලද වැඩ විෂය පථයේ විචලනය සාමාන්‍ය ලක්ෂණයක් වු බැවින්, පුනරුත්ථාපන වැඩ සඳහා ප්‍රමාණ පත්‍ර බිම් මට්ටමේ සමීක්ෂණයකින් තොරව සිදුකර තිබුණි. පැකේජ අංක 01 යටතේ රු.මිලියන 58.82 ක් වටිනා වැඩ හා පැකේජ අංක 02 යටතේ රු.මිලියන 39.03 ක් වටිනා වැඩ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් අනුමත කර නොතිබුණි.

(ඇ) කණු වෙනත් තැනකට ගෙන යාම සඳහා ලංකා විදුලි බල මණ්ඩලයට හා ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත 2013 වර්ෂය තුළ පැකේජ අංක 02 යටතේ එකතුව රු.මිලියන 65 ක් වු ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වුවද යළි ස්ථානගත කිරීම් වැඩ පිළිබඳ ප්‍රගතිය මන්දගාමී විය.

(ඇ) කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල ඩී-43 වගන්තියට අනුව, වැඩ නිම කිරීමෙන් පසුව දින 7 ක් ඇතුළත ව්‍යාපෘතිය විසින් නිම කරන ලද වැඩ භාර ගත යුතුය. කෙසේ වුවද 2012 ඔක්තෝබර් 26 දිනට නිම කර තිබුණු වැඩ ව්‍යාපෘතිය විසින් දින 07 ක් තුළ භාර ගෙන

නොතිබුණි. තවද 2013 සැප්තැම්බර් 03 දින නිම කර තිබුණු පැකේජ 2 යටතේ වැඩ මාස 4 ක ප්‍රමාදයකින් පසුව 2014 ජනවාරි 13 දින ව්‍යාපෘතිය විසින් භාර ගෙන තිබුණි.

(ඉ) කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවල ජීසීජී 55.1 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතිය නිමවූ දින සිට මාස තුනක් ඇතුළත කොන්ත්‍රාත්කරු විසින් වැඩ නිමවීමෙන් පසු තත්ත්වය පිළිබඳ සැලසුම් (as Built Drawings ) උපදේශක අනුමැතිය ලබාගැනීමෙන් පසු ඉදිරිපත් කළ යුතුය. එහෙත් කොන්ත්‍රාත් කරු එම සැලසුම් මෙම වාර්තාවේ දිනය දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

## 6.3 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------

කොන්ත්‍රාත්තු නැවැත්වීම සම්බන්ධයෙන් නීතිමය ලියකියවිලි පිළියෙල කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී නීති වියදම් ලෙස රු.443,372 ක මුදලක් ගෙවා තිබුණි. නීති සේවා සඳහා පළාත් සභාව විසින් ඒ වන විටත් පිළිවෙලින් රු.70,000 ක හා රු.50,000 ක මාසික දීමනාවකට නීති නිලධාරින් දෙදෙනෙකු පත් කර තිබුණද රු.444,370 ක මුදලක් තීරකවරුන්ට ගෙවා තිබුණි.

## 6.4 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 සිට 2013 වර්ෂ සඳහා සම්බන්ධීකරණ දීමනා ලෙස රු.10,500,000 ක මුදලක් ප්‍රධාන ලේකම්, යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) වෙත ගෙවා තිබුණි. පෙර වර්ෂවල විගණන වාර්තාවලින් පෙන්වා දුන් කරුණු පදනම් කර ගෙන දීමනා ගෙවීමට අදාළ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය 2013 නොවැම්බර් 28 දින සිට බලපැවැත්වෙන පරිදි ලබාගෙන තිබුණි. කෙසේ වුවද අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමට පෙර සිදුකරන ලද ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මාසික සම්බන්ධිකරණ දීමනා ගෙවනු ලබන නිලධාරින්ගේ මාසික ආදායම රු.50,000 ඉක්මවා තිබුණද , 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව උපයන විට ගෙවීම් බදු අයකර ගෙන නොතිබුණි.

**7. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) විධිමත් ගිණුම් වාර්තා පවත්වා ගැනීම

(ඇ) අත්තිකාරම් හා අග්‍රිම

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය